දිනය: 2022.05.16
අංකය: 26

**<u>මාධ්‍ය නිවේදනයයි</u>**
**<u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව</u>**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ එක්දින හා සාමාන්‍ය සේවය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු 2022.05.17 දින සිට සාමාන්‍ය පරිදි ආරම්භ වේ. මෙම සේවාවන් සඳහා කලින් දිනයක් හා වේලාවක් වෙන් කර ගෙන පැමිණීම අනිවාර්ය වේ. ඒ සඳහා www.immigration.gov.lk වෙබ් අඩවිය හෝ 0707101060 දුරකථන අංකය භාවිතා කරන මෙන් දැනුම් දෙන අතර දුරකථන අංකය භාවිතා කරන්නේ නම් රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා ඒ සඳහා පහසුකම් සලසා ඇත.

දෙපාර්තමේන්තුවේ දෛනික ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ධාරිතාව ගමන් බලපත්‍ර 2,000 පමණ වන බැවින් කලින් දිනයක් හා වේලාවක් වෙන් කර නොගෙන පැමිණීමෙන් සිදුවන අපහසුතාවය වළක්වා ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ගමන් බලපත්‍ර ගාස්තු ඉහළ යාමක් හෝ ගමන් බලපත්‍ර තොග අවසන් වන බවට වන ප්‍රචාර නිවැරදි නොවන බව අවධාරණය කරන අතර ඔබ වෙනුවෙන් සේවා සැපයීම සඳහා අප දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ඉතා කැපවීමෙන් කටයුතු කරන බවද කාරුණිකව දැනුම් දීමට කැමැත්තෙමි.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව